# ප්‍රථම අභ්‍යවකාශ ගවේශකයා

ලෝක ඉතිහාසයේ මෙතෙක් වාර්තාවී ඇති ප්‍රථම අභ්‍යවකාශගාමියා නම් ඍධි බලයෙන් අගතැන්පත් මුගලන් මහරහතන් වහන්සේය.

උන්වහන්සේට විශ්වයේ කෙළවර සොයා යාමට අදහසක් පහලවිය. බුදුන් වහන්සේට එම අදහස ඉදිරිපත් කළවිට, එය කිසිම පලක් නැති වැඩක් බවත්, කිසිවෙකුටත් කළනොහැකි දෙයක් බවත් වැඩිදුරටත් දේශනාකළසේක.

නමුත් මීටපෙරත් අභ්‍යවකාශයේ සැරිසරා ඇති මුගලන් මහරහතන් වහන්සේ, එය කළහැකිය යන මතයේ සිටි බැවින් ඍධි බලයෙන් කෝටි ගණන් චක්‍රාවාට පසුකරමින් විශ්වයේ ඈතටම, ආලෝකවර්ෂ දසදහස් ගණන් ඈතට ගොස්, දින හතකට පසු එය නිශ්ඵල ප්‍රයත්නයක්බව අවබෝධ කරගෙන ආපසු ඒමට තීරණය කරන ලදී. නමුත් ඒ සඳහා තවත් දින හතක් ගතවන බැවින් එතෙක් කල් නිරාහාරව ජීවත්විය නොහැකිබව අවබෝධ කරගත් උන්වහන්සේ පිරිනිවන්පෑමට තීරණය කළසේක.

එකෙනෙහිම බුදුරජානන් වහන්සේට තම දිව්‍යඥාණයෙන් ඒබව දැනගන්නට ලැබුනෙන් තම අසීමිත ඍධි බලය භාවිතයෙන් එක් මොහොතකින් මුගලන් තෙරුන්වහන්සේව තමා ළඟට ගෙන්වාගත් සේක.

- JTW -